**වැලිගම නගර සභාව - 2021**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

වැලිගම නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**-------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රතිපූර්ණය නොවූ ස්ථිර සේවක වැටුප් රු.215,096 ක් හා වැඩියෙන් ප්‍රතිපූර්ණය වූ මන්ත්‍රී දීමනා රු. 113,333ක් ද ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථිර සේවක වැටුප් හා සේවක ණය පොලී 2022 ජනවාරි ප්‍රතිපූර්ණය කර තිබෙන බවත්, වැඩියෙන් ප්‍රතිපූර්ණය වූ මන්ත්‍රී දීමනා 2022 වර්ෂයේදී හිලව් කර ගන්නා ලෙස පලාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂය සඳහා අවස්ථා දෙකකදී රු.1,000,000 ක විගණන ගාස්තු සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා තිබූ අතර, සත්‍ය විගණන ගාස්තු රු. 391,500 ක් නිරවුල් කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | ජ'නල් ගැලපීම් මගින් අමතර ප්‍රතිපාදන ඉවත් කිරීමට මේ වන විට කටයුතු කර තිබෙන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන/ උපයෝගී ලේඛනවල දැක්වෙන වටිනාකම් අතර රු.5,807,315 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශ, විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ හා ශේෂ ලැයිස්තු ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,031,032 ක් වූ ගිණුම් විෂයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ප්‍රමාණවත් තොරතුරු සොයා ගැනීමට නොමැති බව. | ගිණුම්වල දැක්වෙන ශේෂයන් තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි තබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,991,088 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 25,284,612 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) | වරිපනම්<br>---------- | | |
| | **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **සභාවේ අදහස් දැක්වීම**<br>-------------------------- | **නිර්දේශය**<br>------------ |
| | සමාලෝචිත වර්ෂයේ අවසානයට වරිපනම් ඒකක 6014 කින් රු.12,098,252 ක හිඟ ශේෂයක් පැවති අතර ඉන් රාජ්‍ය ආයතනවලට අයත් දේපල 8 කින් එකතුව රු.278,002 ක හිඟ වරිපනම් ආදායමක් පැවතුණි. | පැවති කොරෝනා වසංගතය සමඟ හිඟ ආදායම් අය කර ගැනීම සඳහා කටයුතු කිරීමට නොහැකි වූ බවත්, දැනට හිඟ වරිපනම් බදු අය කර ගැනීම සඳහා ජංගම සේවා පැවැත්වීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | කඩකුලී<br>-------- | | |
| | **විගණන නිරීක්ෂණය**<br>-------------------- | **සභාවේ අදහස් දැක්වීම**<br>---------------------- | **නිර්දේශය**<br>--------- |
| | සමාලෝචිත වර්ෂය අවසානයට බදුකරුවන් 122 කින් රු.10,162,260 ක් හිඟව පැවතුණි. | 2020 වර්ෂයට සාපේක්ෂව රැස් කළ ආදායමේ වර්ධනයක් ඇති වී තිබෙන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | බදුකුලී<br>------- | | |
| | **විගණන නිරීක්ෂණය**<br>-------------------- | **සභාවේ අදහස් දැක්වීම**<br>---------------------- | **නිර්දේශය**<br>---------- |
| | සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.5,867,985ක් හිඟව පැවතුණි. | හිඟ බදු කුලී මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු සඳහා යොමු කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | තානායම් කුලී<br>--------------- | | |
| | **විගණන නිරීක්ෂණය**<br>--------------------- | **සභාවේ අදහස් දැක්වීම**<br>----------------------- | **නිර්දේශය**<br>---------- |
| | සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,462,974 ක් හිඟව පැවතුණි. | හිඟ තානායම් කුලී අය කර ගැනීම සඳහා ලිපි මගින් දැනුවත් කිරීම් සිදු කර ඇති බවත්, වැලිගම තානායම නගර සභාව වෙත පවරා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්තුමාට හා දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙත ලිපි යොමු කර තිබෙන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ මුර සේවය සඳහා 2014 වර්ෂයේ සිට මුරකරුවන් 06 දෙනෙකු බඳවාගෙන තිබියදීත් නගර සභා කාර්යාලය හා කප්පරතොට කොම්පෝස්ට් අංගනයේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් පැය 12 ක සේවා මුරයක් සඳහා රු.980 ක් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට මාර්තු මාසය දක්වා පෞද්ගලික ආරක්ෂක ආයතනයකින් ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීම හේතුවෙන් වැටුප් හා දීමනා සඳහා රු.352,800 ක් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් සිට 2022 වර්ෂයේ පෙබරවාරි දක්වා තවත් පෞද්ගලික ආරක්ෂක ආයතනයකින් පැය 12 ක සේවා මුරයක් සඳහා රු.1,174.2 ක් ගෙවීමේ පදනම මත ආරක්ෂක නිලධාරීන් හතරදෙනෙකුගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.347,577 ක් ගෙවා තිබුණි. | අතිකාල දීමනා ගෙවීම අවශ්‍ය නොවීම, මුරකරුවන් 06 දෙනෙකුගෙන් ලබා ගන්නා සේවයට සමාන සේවයක් ආරක්ෂක නිළධාරින් 04 දෙනකුගෙන් ලබා ගත හැකි වීම, පරිපාලන ගැටළු රැසක් අවම වීම, පොහොර සහ යම් යම් අයිතමයන්හි සිදුවිය හැකි සොරකම් අඩුවීම, නිතර අධීක්ෂණය කිරීමට අවශ්‍ය නොවීම යනාදී කරුණු හේතුවෙන් ආරක්ෂක සේවයක් ක්‍රියාත්මක කර ඇති බව. | සේවා ලබා ගැනීමේ පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවට අයත් නාගරික බල ප්‍රදේශය තුළ ඉදිකරමින් පැවති හා ඉදිකර අවසන් කර තිබූ ගොඩනැගිලි 03 කට අදාලව සැලසුම් අනුමත කර තිබුණේද යන්න සනාථ කර ගැනීම සඳහා වූ සාක්ෂි ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී විගණනයට ඉදිරිපත් නොවූ අතර, විවිධ හේතුමත අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද ගොඩනැගිලි අයදුම්පත් 05කට හා නිසි සංවර්ධන බලපත්‍ර ලබාගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසිවල ඇතුළත් අංක 2235/54 දරන හා 2021 ජූලි 08 දිනැති ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.594,900 ක ගාස්තු අය කර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදාළ අනවසර ඉදිකිරීම් විධිමත් කිරීම සඳහා ලිඛිතව දැනුම්දීම සිදු කර ඇති බවත්, අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ගොඩනැගිලි ඉදිකිරීම් දින 07ක් තුළ අනුමත කර ගන්නා ලෙස සිහිකැදවීම් ලිපි යැවීම සිදු කරන ලද බව. | ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය හා සමාලෝචිත වර්ෂවලදී සභා අරමුදල් මත රු.8,400,015 ක ඇස්තමේන්තුවකට ප්‍රජා කොන්ත්‍රාත් සංවිධාන වෙත පවරා දී තිබූ කාණු පද්ධති හා මාර්ග සංවර්ධනය කිරීමේ කර්මාන්ත 18 කට අදාලව 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීමේ වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2019 වර්ෂයේ දෙවන භාගයට අදාළ ST – 047 රේටය වූ රු.17,227.95 ක් වෙනුවට රු.20,589ක රේටය භාවිතා කිරීම නිසා කර්මාන්ත 18 ට අදාලව කොන්ක්‍රීට් ඝන මීටර් 69 ක් යෙදීම වෙනුවෙන් ඝන මීටරයක් සඳහා රු.3,361.05 බැගින් රු.231,912ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | මේ වන විට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නව මිල ගණන් ලැබී ඇති බැවින් කර්මාන්ත සඳහා එම මිල ගණන් පමණක් භාවිතා කරනු ලබන බව. | නිවැරදිව බිල්පත් පිළියෙල කළ යුතුය. |